**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 22 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගෙවිය යුතු ගිණුම් | | |
| | 1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ගෙවා නොතිබුණු වැටුප් හා කුලී එකතුව රු.442,246 ක් තහවුරු කර ආදායමට මාරු කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි. | අදාළ ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ඒවායේ වටිනාකම සභාවේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් ලබාගත් පසු අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | විගණනය සඳහා සාක්ෂි නොවීම. | | |
| | රු.1,430,029 ක් වටිනා නොගෙවූ වැටුප්, කුලී, බැංකු පොලි, මූලධන ආදායම් ආදිය සඳහා විස්තරාත්මක උපලේඛන සහ වරිපනම් බදු සඳහා වරිපනම් බදු ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් සමග අදාළ විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ විස්තරාත්මක ලේඛන ප්‍රාදේශීය සභා ගොනුවේ අමුණා තිබෙන අතර, වාර්ෂික ගිණුම්වලට අමුණා එවීමට නොහැකි වී ඇති බව කරුණාවෙන් දන්වමි. |

**1.4** **අනුකූල නොවීම**

**---------------------**

**නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------**

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ---------------------- | -------------------- | ------------------ | -------------------- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 5 (XII) | ප්‍රාදේශීය සභාවල කාර්යයන් පහසු කිරීමේ අරමුණෙන් නිවැරදි තීරණ ලබාගැනීම සඳහා මූල්‍ය හා ප්‍රතිපත්ති සැලසුම් කිරීම, නිවාස ඉදිකිරීම සහ සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පරිසර හා පොදු පහසුකම් ආදි විෂයයන් වෙන වෙනම කමිටු ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදලේ ප්‍රමාණය තීරණය කර අයකිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | දැනට කළමනාකාර සහකාරවරුන් පමණක් කාලයෙන් කාලයට රාජකාරී ඉටු කරයි. ගබඩා භාරකරු යන තනතුර සඳහන් කරමින් කළමනාකාර සහකරුට තනතුරු ලබා නොදුන් බැවින් ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | |
| | (i) මුදල් රෙගුලාසි 396 | මාස 06 කට පෙර ලබාදුන්, එහෙත් බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු.180,220 ක් වටිනා චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මාරු නොකළ චෙක්පත් 16 න් මාරු නොකළ එකතුව රු.165,238.95 ක චෙක්පත් 11 ගලපා ඇත. ඉතිරි මාරු නොකළ චෙක්පත් 05 සම්බන්ධයෙන් පියවර ගෙන ඇත. |
| | (ii) මුදල් රෙගුලාසි571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.20,524,793 ක තැන්පතු සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් ආදායමට මාරු කිරීමට කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 30,807,863 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,718,425 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම්හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 10.603 | 12,584 | 11,668 | 7,200 | 9,202 | 6,367 | 6,731 | 6,284 |
| කුලී | 6,357 | 5,159 | 4,664 | 4,116 | 7,386 | 4,729 | 4,427 | 3,621 |
| බලපත්‍ර ගාස්තු | 1,643 | 1,201 | 1,201 | 4 | 1,290 | | | |
| | | | | | | 1,721 | 1,721 | 4 |
| අනෙකුත් ආදායම් | 25,338 | 42,567 | 42,373 | 501 | 11,414 | 1,777 | 1,755 | 493 |

සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු පසුගිය වර්ෂයට වඩා රු.916,000 කින් වැඩි වී තිබුණි. මෙය වරිපනම් බදු අයකිරීමේ මන්දගාමී ස්වරූපය පෙන්නුම් කරයි. තවද, කඩ කුලී සහ අනෙකුත් හිඟ පිළිවෙලින් රු.495,000 ක් සහ රු.8,000 කින් ඉහළ ගොස් තිබීම එම ආදායම්වල අයකිරීම් මන්දගාමී ආකාරයෙන් සිදු වන බව හෙළිදරව් කරයි.

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ පවතින ඉඩම් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලිවලින් 2005 වර්ෂයේ සිට මේ දක්වා අයකළ යුතු එකතුව රු.7,197,663 ක වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වරිපනම් අයකිරීම පිළිබඳ පසුගිය වර්ෂවල රටේ ඇති වූ අසමතුලිත තත්ත්වය නිසා මහජනතාවගෙන් අයකළ නොහැකි විය. මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් ලබාගැනීමට නියමිතය. |

**2.2.3** **කඩකුලී ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මස් කඩ බදුකරුව බදු ගෙවීම පැහැර හැරී විටකදී ඔවුන්ගේ ඇපවලින් බදු වටිනාකම අය කර ගත යුතු වුවද වර්ෂ අවසානයේ මෙම ක්‍රියාව අනුගමනය කරන නිසා රු.3,634,077 ක හිඟ බදු අය නොකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරුණි. | අයකර ගත යුතු හිඟ මුදල් සියල්ල අයකර ගත යුතු අතර අනෙකුත් ඒවා සම්බන්ධයෙන් අදාළ පරිදි කටයුතු කළ යුතු වේ. | |

**2.2.4** **මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජනවාරි සිට මේ දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. | 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.9,249,570 වක් වටිනා මුදල් 2019.04.05 දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණි. මේ සඳහා අදාළ ආකෘති ඉල්ලුම් පත් 2019.04.18 දින ඉල්ලීම් කර ඇත. 2018 වර්ෂයේ සිට ලබාගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ආරම්භ නොකළ කොන්ත්‍රාත්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) බහාළුම් ටැංකි සහ ගෑස් ගොඩනැගිලි ඉදිකිරීම - නිලාවෙලි | | |
| සභාවේ ප්‍රතිපාදන යටතේ බහාළුම් ටැංකි හා ගෑස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.7,054,086 කට ගිවිසුම් 2017 අගෝස්තු 03 දින පිරිනමා තිබුණි. මෙම වැඩසටහන සිදුකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා පිළියෙල නොකර ලංසු කැඳවා මහජනතාව පදිංචි ප්‍රදේශයේම පිහිටි ඉඩම තෝරාගෙන කාර්යයන් ආරම්භ කිරීමට කටයුතු කර තිබුණි. මේ නිසා තමන්ට සෞඛ්‍ය ගැටළුවලට මුහුණපෑමට සිදු වන බව මහජනතාව විසින් විරෝධය පළකර තිබුණි. එම නිසා 2019 මැයි 16 දින වන විටත් මෙම වැඩසටහන ආරම්භ කර නොතිබුණි. | පසුගිය වර්ෂ දෙකේදී මෙම කාර්යය ආරම්භ කර නොතිබුණි. මෙයට සුදුසු ඉඩම් ලබාගනිමින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු ඉඩමක් ලබාගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. |
| (ii) ගෑස් ගොඩනැගිල්ල ඉදිකිරීම - පුල්මුඩ්ඩේ | | |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් රු.2,000,000 ක වටිනාකමට ගෑස් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කර තිබුණද, මේ දක්වා මෙය ආරම්භ කර නොතිබුණි. | ගෑස් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | ගෑස් වැඩසටහන ආරම්භ කිරීමට අවශ්‍ය මානව සම්පත් අනුමත නොවූ බැවින් මෙය ආරම්භ කර නොතිබුණි. |

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම පරිසර අධිකාරියේ “පිළිසරු” වැඩසටහන යටතේ, ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය නිලාවෙලිහි රු.17,943,879 ක | පසුගිය වර්ෂ 03 ක කාලයේ ජල සම්බන්ධතාවය ලබා නොගැනීම නිසා | කරදිය පැවැති බැවින් ආරම්භ කළ නොහැකි විය. වර්තමානයේ ජල සම්බන්ධතා ලබාගැනීමට කටයුතු කර ඇත. ජල |

| | | |
|---|---|---|
| වටිනාකමින් ඉදිකර 2016 මාර්තු 26 දින සභාවට භාර දී තිබුණි. එසේ වුවත්, මේ දක්වා ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම නිසා දරන ලද වියදම් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | නිෂ්කාර්යව පවතින ගොඩනැගිල්ල අදාළ අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | සම්බන්ධතාවය ලැබූ වහාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව මෙම කාරණාව සම්බන්ධයෙන් සම්පූර්ණ පැහැදිලි කිරීම් ලබාගෙන තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ මෙහෙයුම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 අයවැය සැලැස්මේ අතිගරු ජනාධිපතිවරයාගේ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පලකළ චක්‍රලේඛවලට අනුකූලව මත්ද්‍රව්‍ය මර්ධනය කිරීමේ කටයුතු, බෝ නොවන රෝග සම්බන්ධ කටයුතු ආදිය මඟින් මනා සෞඛ්‍යය පවත්වාගෙන යයි. ගස් වැවීම් සිදු කර ඇත. තවද, තිරසාර සංවර්ධනය පිළිබඳ වැඩසටහන් යෝජනා ඉල්ලීම් කර ලිපි යවා ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා බැංකුවේ තැන්පත් කර උපලබ්ධි නොවූ චෙක්පත් 05 ක එකතුව රු.15,603 ක වටිනාකම අදාළ පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කළ යුතුවේ. | රැස් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. |
| (ii) | නල ජල බෙදාහැරීමේ වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රජා මධ්‍යස්ථානවලට 2013 වර්ෂයේදී අත්තිකාරම් ලෙස ලබාදුන් රු.700,000 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වටිනාකම ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව විසින් භාවිතා කරනු ලැබූ පිකප් වාහනය 2015 වර්ෂයේදී අනතුරට පත්ව සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. එසේ වුවත්, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විමර්ශන කමිටුව පත්කර අලාභයේ වටිනාකම සහ අනතුරට වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ ක්‍රියාමාර්ග සිදුකළ යුතු වේ. | අලාභයේ වටිනාකම රක්ෂණ ආයතනය මඟින් ලබාගෙන අලුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iv) | නිශ්චිතව වෙන්කරන ලද ප්‍රතිපාදන යටතේ වූ මූල්‍ය ප්‍රතිපාදනවලින් කට්ටුක්කුලම්හි රු.316,460 කින් ඉදිකළ පොදු ළිඳ පැවති ඉඩමේ අයිතිය තනි පුද්ගලයෙකුට අයත්ය. එසේ වුවත්, මෙම ඉඩමේ අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පැවරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | සභාවේ නමට පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් කටයුතු කරමින් පවතී. |
| (v) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින සංචාරක නිකේතනවලින් වාර්ෂික ආදායමින් සියයට 01 ක බලපත්‍ර ගාස්තු සභාව විසින් අයකළ යුතුය. එසේ වුවත්, සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින සංචාරක නිකේතන 10 ක් සඳහා සියයට 01 ක ගාස්තු අයනොකර වාර්ෂිකව ආසන්න වශයෙන් රු.1,500,000 ක ආදායම් සභාවට අහිමි වී තිබුණි. | මෙම කරුණ සම්බන්ධ අදාළ ක්‍රියාමාර්ග ගෙන ආදායම් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | කටයුතු කෙරෙමින් පවතී. |
| (vi) | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍ර ලේඛයේ 7 ඡේදය ප්‍රකාරව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය නොමැතිව සභාවේ ලේකම්වරයා විසින් 2015 වර්ෂයේදී සේවකයින් 140 දෙනෙකුට අනියම් පදනමින් බඳවාගෙන තිබුණි. එසේ ලබා දුන්නද, එලෙස සේවකයන් බඳවා ගැනීම සඳහා අවශ්‍යතාවය සභාවේ නොපැවතුණි. තවද, මෙම සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා සභාවේ හිටපු ලේකම්වරයා විසින් 2015 වර්ෂයේදී ලබාගෙන තිබූ රු.1,493,294 ක අත්තිකාරම් | මෙම කරුණ සම්බන්ධයෙන් අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කොට වැඩිදුර කටයුතු සිදුකළ යුතු වේ. | කටයුතු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | | |
| (vii) | ප්‍රධාන ලේකම්, කාර්යාල චක්‍රලේඛයේ 10/2009, (2) වගන්තිය අනුව වාර්ෂික තොග සමීක්ෂණ මණ්ඩල ගෙවීම් කිරීමේදී සභාපතිවරයාට රු.5,000 ක වැටුපක් හා සාමාජිකයන්ට රු.4,000 බැගින් වැටුපක් ලබාදිය හැකිය. එබැවින්, 2015 වර්ෂය සඳහා ගෙවීම් ලෙස එකතුව රු.13,000 ක් ගෙවිය යුතුව තිබුණි. එසේ වුවත්, සභාව රු.25,000 ක් ගෙවා තිබීම නිසා රු.12,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2019 මැයි 16 දින වන විටත් මෙම වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩියෙන් ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කටයුතු කෙරෙමින් පවතී. |
| (viii) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව, පළාත් පාලන ආයතනවල අනියම් හා තාවකාලික පදනමින් බඳවා ගනු ලැබූ සේවකයන් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. එසේ වුවත්, මෙයට පටහැනිව සභාවේ රාජකාරී කළ සේවකයන් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙනුවට සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා තිබූ අතර 2010 ජනවාරි සිට 2014 නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් අදාළ කාලය තුළදී නොගෙවීම නිසා එම අරමුදල රු.1,915,306 ක දඩ ගාස්තු ගෙවන ලෙස දන්වා තිබුණි. එසේ වුවත්, 2019 මැයි 16 දින දක්වා මෙම වැඩිපුර මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් සුදුසු පියවර අදාළ බලධාරීන් මාර්ගයෙන් සිදුකළ යුතු වේ. | කපා හැරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (xi) | ප්‍රාදේශීය සභාව විසින් පුල්මුඩේවල රු.24,444,588 ක වියදමින් කඩ කාමර 35 ක් සහිත වෙළඳපොල ගොඩනැගිල්ල පුල්මුඩේ වැවේ පස් පුරවා ඉදිකළ බැවින් මධ්‍යම පරිසර අධිකාරිය සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. තවද, | මෙම කඩ කාමර භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | කටයුතු කරනු ලැබේ. |

මෙම කඩ කාමර ඉදිකිරීමට ප්‍රථම වෙළඳාම සඳහා සුදුසු ඉඩමක්ද යන්න පරීක්ෂා නොකර කඩ කාමර ඉදිකර තිබුණි. එබැවින්, එම කඩ කාමර ඉදිකල දිනයේ සිට මේ දක්වා සියළුම කඩ කාමර භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවෙන් ස්ථාන මාරු වීම් ලබා ගිය සහ සේවය හැර ගිය සේවකයන් 05 දෙනෙකුට ලබාදුන් රු.214,205 ක හිඟ ණය ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය අයකර ගැනිමට කටයුතු කළ යුතු වේ. | කටයුතු කරනු ලැබේ. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සභාපතිවරයා 2015 පෙබරවාරි 05 දිනත්, 2015 මාර්තු 23, 24 සහ 25 දිනවලත් රාජකාරීමය වශයෙන් සභා බල ප්‍රදේශයට අයත් කාර්යාලවලටත්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයටත් යැම එම ගමන වෙනුවෙන් භාවිතා කළ වාහනයේ ධාවන සටහන්වල සඳහන් වුවද, එම දිනවල ඔහු කොළඹ රාජකාරී වශයෙන් ගමන් කළ බවට සඳහන් කර සංයුක්ත දීමනා හා ගමන් වියදම් වශයෙන් රු.43,100 ක් ලබාගෙන තිබුණි. 2019 මැයි 16 දින වන විටත් මෙය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳව මාගේ පසුගිය වර්ෂයේ වාර්තාවේ සඳහන් වුවත්, මේ දක්වා කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අදාල අයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කටයුතු කරනු ලැබේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනෙකුත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලබාගෙන තිබූ වාහන 08 ක් වර්ෂ 07 කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කරමින් පැවතුණද ඒවා සභාවේ නමට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ කරුණ සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කොට වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මේ කරුණ සම්බන්ධයෙන් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

### 3.5.2 නිෂ්කාර්යව පවතින වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ඇති ට්‍රැක්ටර් 02 ක්, පිකප්, යතුරු පැදි, ටිපර්, කසළ ඉවත්කිරීමේ බවුසර් වැනි අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින නමුත් වර්ෂ 01 සිට වර්ෂ 05 කට අධික කාලයක සිට අලුත්වැඩියා කර භාවිතා කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | සභාවේ ඇති ට්‍රැක්ටර් 02 ක්, පිකප්, යතුරු පැදි, ටිපර්, කසළ ඉවත්කිරීමේ බවුසර් වැනි අලුත්වැඩියා කර භාවිතා කළ හැකි වාහන භාවිතා කිරීම හා අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. | තොග සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුවත් සභාවේ තීරණය අනුවත් ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |

**3.6 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම<br><br>මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු වැඩසටහන යටතේ සන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ගිවිසුම් රු.4,946,825 කට සිල්මියා කොන්ත්‍රාත්කරුට 2015 ඔක්තෝබර් 19 දින පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | මෙම සන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මෙම ගොඩනැගිල්ලට විදුලිය සැපයීම ජලය බෙදාහැරීම සහ ගොඩනැගිල්ල වටා තාප්ප බැඳීම වැනි කාර්යයන් ඇස්තමේන්තුවේ ඇතුළත් කර නොතිබුණි. එම නිසා, මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් නිම වූ පසුවත් භාවිතා කළ නොහැකි තත්ත්වයක් උදා වේ. | විදුලිය සැපයීම, ජලය බෙදාහැරීම, ගොඩනැගිල්ල වටා තාප්ප බැඳීම සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අමතර ප්‍රතිපාදන නොමැති වීමෙන් විදුලිය. ජලය, තාප්ප වැනි කාර්යයන් ඇතුළත් නොකරන ලදී. |
| (ii) | මෙම කාර්යය 2015 දෙසැම්බර් 19 දින කොන්ත්‍රාත්කරු විසින් නිම කර සභාවට භාරදිය යුතු විය. එසේ වුවත්, 2018 ජූලි 18 දින දක්වා කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කාර්යයන් අවසන් නොකර අත්හැර දමා තිබූ බැවින් අවසන් නොවූ 60% ක කාර්යයන් සඳහා රු.2,947,682 ක් වැයකර ඉදිකළ මෙම ගොඩනැගිල්ල නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි. එසේම, සන අපද්‍රව්‍ය කළමනාකරණ මෙහෙයුම්ද සභාව විසින් ඉදිරියට ගෙන යා නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණ රැස්කිරීම් මධ්‍යස්ථානවලට දැනුවත් කර අපද්‍රව්‍ය කළමනාකරණය කල යුතු වේ. | කාර්යය අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභා බල ප්‍රදේශයේ රැස්කරනු ලබන අපද්‍රව්‍ය පුල්මුඩේ හි පිහිටි පුද්ගලික ඉඩමක බැහැර කරමින් පවතී. මේ නිසා එම ප්‍රදේශයේ පාරිසරික ගැටළු මතු වීමේ තත්ත්වයක් පවතී. | - | සුදුසු ඉඩමක් ලබාගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ආ) | සෙන්දූර් ග්‍රාමීය මාර්ගයට කොන්ක්‍රීට් දැමීම<br>-----------------------------------<br>පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන් මූල්‍ය ප්‍රතිපාදන යටතේ සෙන්දූර් ග්‍රාමීය මාර්ගයට කොන්ක්‍රීට් දැමීම සඳහා ගිවිසුම් පිරිනමා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය (NCB) අනුගමනය කිරීමේදී අවම දින 21 ක් පැවතිය යුතු බව සඳහන් වේ. එසේ වුවත්. සභාව විසින් කැඳවා තිබූ මිල කැඳවීම් සඳහා දින 14 ක් පැවතුණි. | ගිවිසුම් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ අනිවාර්යයෙන් අනුගමනය කළ යුතුය. | අ සිට ඈ දක්වා මේ සඳහා පිළිතුරු දැනටමත් යවා ඇත. පිටපතක් අමුණා ඇත. |
| (ii) | 2017 ජුනි 30 දින සිට 2017 ජුලි 13 දින දක්වා මිල කැඳවීම් ලබාගැනීමේ කාලය ලෙස සභාව විසින් තීරණය කර තිබුණි. එසේ වුවත්, සභාව විසින් මිල ගණන් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් 2017 ජුලි 01 හා 04 දිනවල ප්‍රචාරණය කර තිබුණි. නමුත් මෙම කාල පරාසයේ දින 04 ක් නිවාඩු දින වූ අතර දින 09 ක් පමණක් මිල කැඳවීමේ ලේඛන බෙදාහැරිය හැකි දින ලෙස පැවති හෙයින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) මාර්ගෝපදේශයේ සඳහන් අරමුණ ඉටු වී නොතිබුණි. | | |
| (iii) | මෙම කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු අයදුම් කර තිබුණි. එනමුත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිල ගණන් පරීක්ෂා නොකොට එක් කොන්ත්‍රාත්කරුවෙකුට රු.4,262,496 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| | තවද, පිරිනමන ලද කොන්ත්‍රාත්කරු කාර්යය අත්හැර දැමූ බැවින් අනෙක් සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරුට කාර්යය පැවරීමට නොහැකි වූයෙන් නැවතත් මිල ගණන් කැඳවීමට සිදු වී තිබුණි. | | |
| (iv) | තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු අදාළ කාර්යය භාරගත් පසුව එම කාර්යය ආරම්භ නොකර හා කිසිඳු දැනුම් දීමකින්ද තොරව අත්හැර දැමූ බැවින්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ඇ) මාර්ගෝපදේශය අනුව, රු.51,200 ක ලංසු ඇපකරය (Bid Bond) මුදල් කර නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට එරෙහිව වැඩිදුර ක්‍රියාමාර්ග සභාව ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු ඇපකර රු.51,200 ක් මුදල් නොකිරීම නිසා එම වටිනාකම අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | |
| (v) | සභාව විසින් මෙම කාර්යය සඳහා නැවතත් සී/ස ජාතික තරඟකාරී ලංසු (LNCB) කැඳවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් දින 14 ක් පැවතිය යුතු බව සඳහන් කර තිබුණි. නමුත් දින 07 ක් පමණක් ඇතුළත් කර ලංසු කැඳවා අසාධු ලේඛන (Black List)කරන ලද මිල කැඳවීම්වල වූ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාවම නැවතත් තෝරාගෙන කිසිඳු ලිඛිත දැනුම්දීමකින් තොරව සීමාසහිත ජාතික තරඟකාරී ලංසු පිරිනමා ඔවුන්ගෙන් එක් අයෙකුට රු.5,000,000 ක වටිනාකමට ගිවිසුම් පිරිනමා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමේදී විධිමත්ව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර, අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් හදිසියේ ලබාදීමේදී රජයේ මුදල්වලට පාඩු සිදු නොවන අයුරින් කටයුතු කළ යුතුය. මෙලෙස සේවකයන්ගේ නොසැලකිලිමත්භාවය නිසා පාඩු සිදුවීමේදී එයට වගකිව යුතු අය හඳුනාගෙන පාඩු හිලව් කිරීමට කටයුතු කළ යුතුය. | අවශ්‍යතාවය මත සිදුකරන ලදී. |
| (ඇ) | සංස්කෘතික ගොඩනැගිල්ල ඉදිකිරීම<br>----------------------------------- | | |
| | පුර නැඟුම වැඩසටහන යටතේ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් රු.5,656,434 කට 2016 අප්‍රේල් 18 දින එක් කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. සභාව විසින් පිරිනමා තිබුණු යෝජනාවලට අනුකූලව සංස්කෘතික | සභාව විසින් අදාළ පිළිතුරු අප වෙත ඉදිරිපත් කළ යුතුය. සිදු වූ පාඩුව අයකිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා එම මධ්‍යස්ථානය භාවිතා නොකර එය මහජන බැංකුවට ලබාදීමට තීරණය කර එහි ස්වරූපය වෙනස් කළ අවස්ථාවේදී අලුතින් ඉදිකළ බිත්තියේ 7.78m$^3$ ප්‍රමාණයේ රු.83,246 ක් වටිනා බිත්ති කොටසක් ඉවත් කර තිබුණි.